# දෝසී සීයා



T.M. රනුගි ලසාරා විජේකෝන්

# දෝසි සීයා

T.M. රනුගි ලසාරා විජේකෝන්

කතෘගේ වෙනත් කෘති:

01.මලීගේ හීනය
02.හා පැංචා රැවටුන හැටි
03.මීයාගේ කැදරකම

පාසල : මහ/මහාමායා බාලික විදුහල

ඉගෙනුම ලබන පංතිය : 4 ශ්‍රේණිය E

කෘතිය පළ කරන දිනය : 2026.05.10

ISBN : 978-624-211-372-2

# පිදුම

මෙම පොත ලිවීමට උපදෙස් දුන්

M.G.U. දිල්ෂානි

ගුරු මෑණියන්ටත්,

ආදරණීය දෙමාපියන්ටත්

මේ පොත පුදමි..!



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.


ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.


ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එකෝමත් එක කාලෙක දෝසි විකුණන සීයා කෙනෙක් හිටියා. එයා රසම රස පැණි බේරෙන දෝසි තමයි ගමේ ඉන්න හැම කෙනාටම විකුණුවේ.



ඒත් දෝසි සීයා සල්ලි වලට හරිම ලෝබයි. සල්ලි නැතුව කිසිම කෙනෙකුට දෝසි දුන්නෙ නැහැ.

ඉතින් පුංචි ළමයි දෝසි ඉල්ලද්දි සීයා ළමයින්ට සැර කරලා ළමයින්ව එළවා ගත්තා. “එනවා මෙතන සල්ලි නැතුව දෝසි ගන්න.” අනේ පව් පුංචි ළමයි.



පුංචි ළමයි හරිම ආසයි දෝසි සීයාගේ පැණි බේරෙන දෝසි වලට. ඉතින් දෝසි කන්න ආස ළමයි තමන්ගේ දෙමාපියන්ට කරදර කරමින් දෝසි කන්න සල්ලි ඉල්ලුවා.

දුප්පත් දෙමාපියන්ට ළමයින්ගේ කරදරය හරිම වදයක් උනා. සල්ලි යහමින් තිබෙන අය දෝසි සීයාගෙන් දෝසි මිලදී ගත්තා.



සල්ලි වලට තවත් ලෝභ වුණු දෝසි සීයා දෝසි වල මිල තවත් වැඩි කළා.

දෝසි වල මිල වැඩිවෙනවාත් සමඟම දෝසි කන්න ආසා වුණත් දිනපතා දෝසි ගන්න එක සමහර අයට ප්‍රශ්නයක් වුණා. ඒ නිසා සමහර පුද්ගලයින් දෝසි ගන්න එක අඩු කළා.



මෙහෙම ටික කාලයක් යද්දි දෝසි සීයාගේ දෝසි විකුණුනේ හරිම අඩුවෙන්. ඉතින් දෝසි සීයාට හරිම දුකයි. දෝසි සීයා දෝසි කරත්තෙත් අරගෙන ගම පුරාම ඇවිද්දත් සීයා හිතපු තරම් දෝසි විකිණුනේ නෑ. දෝසි ගන්න බැරි වුන ළමයි දෝසි සීයාට “ලෝභ දෝසි සීයා” කියලා නමකුත් හැදුවා.



තවත් අලුත් දවසක් උදාවුණා. සීයා එදා දවසම දෝසි විකුණන්න ගියේ නැහැ. දවසම දෝසි සීයා කල්පනා කළා ඇයි ගමේ මිනිස්සු මගේ දෝසි ගන්නේ නැත්තෙ කියලා.


අනේ මං මොකක්ද දැන් කරන්නේ? මෙච්චර රසට දෝසි හදලත් ඇයි මිනිස්සු මගේ දෝසි ගන්නේ නැත්තේ.

දෝසි කරත්තේ දෝසි ඉතිරි වුනත් කිසිම කෙනෙකුට දෝසි නොමිලේ නම් දුන්නේ නෑ. මම මහන්සියෙන් හදන දෝසි නිකම් දෙන්න පුළුවන්ද? එහෙම හිතපු දෝසි සීයා ඉතිරි වුණ දෝසි තනියම කෑවා.



වෙළඳාමක් නැතිව නිවසට වී සිටි දෝසි සීයා අධික දුක සහ තරහ නිසාම අසනීප වුණා. සීයා අසනීපයෙන් සිටින බව ආරංචි වුණ ගමේ වැඩිහිටියන් සහ පුංචි ළමයි සීයා බලන්න ආවා.

ආපු එක ළමයෙක් දෝසි සීයේ අපි ඔයාට ගොඩක් ආදරෙයි. සීයා ඉක්මනින් සනීප වෙලා එන්න. ඒක අහපු දෝසි සීයාට ගොඩක් දුක හිතුනා.




මම නපුරු උනේ මට ගොඩක් ආදරේ කරන ළමයින්ට නේද?
සීයා කළකිරීමත් අසනීපයත් සමඟ නිවසේ තනිව සිටින විට
කල්පනා කළා.

කාලය ගත වුණා. සීයාගේ ලෙඩේ සනීප වුණා. සීයා
ආයෙමත් පැණි බේරෙන රසම රස දෝසි හදලා ගමේ ඉන්න
හැමෝටම මිල අඩුවට විකුණුවා. දැන් වෙනදා වගේම ගමේ
ඉන්න හැමෝටම දෝසි කන්න පුළුවන්.

දෝසී.... දෝසී... දෝසී.... ආයෙමත් සීයාගේ කටහඬ ඇහෙද්දි පුංචි ළමයි දුවගෙන ගිහින් දෝසි ඉල්ලුවා. අද නම් මම නොමිලේම දෝසි දෙනවා, කියලා සීයා කිව්වා. දැන් පුංචි ළමයින්ටත් දෝසි සීයටත් හරිම සතුටුයි.

ළමයින්ගේ ආදරය කරුණාව නිසාම සීයා හොඳ කෙනෙක් වුණා. ඒ නිසා සීයාගේ වෙළඳාමත් සරු වුණා.



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)